සියලු ම හිමිකම් ඇවිරිණි [All Rights Reserved]

කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු ප්‍රභා - ජූනි

5 ශ්‍රේණිය - 2024

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව "සිසු ප්‍රභා" ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම අලෙවි කිරීම සපුරා තහනම් වේ.

I පත්‍රය

කාලය : පැය 1 යි.

විභාග අංකය :.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	


	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMP
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය	V/I/S/CH

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 හා 2 ප්‍රශ්නවල කොටු තුනෙන් දෙකක දැක්වෙන රූප අතර සම්බන්ධතාවයක් ඇත. එක් කොටුවක එවැනි සම්බන්ධතාවක් නැත. එම රූප සහිත කොටුව තෝරා යටින් ඉරක් අඳින්න.


1.



(1)




(2)




(3)


2.



(1)




(2)



(3)

- අංක 3 හා 4 ප්‍රශ්නවලට හිස් කොටුවට ආ යුතු රූපය තෝරන්න.

3.





(1)



(2)



(3)

4.





(1)




(2)



(3)

5. බළලුන් හය දෙනෙකුගේ වයස කොටු තුළ සඳහන් වේ.



බළලුන් සිව්දෙනෙකුගේ වයස එකතු කළ විට අවුරුදු 22 කි. ඉතිරි අයගේ වයස පිළිවෙළින්,

(1) 5 , 8 (2) 8 , 5 (3) 10 , 5

විභාග අංකය .....


- **පහත කවි පද දෙක ඇසුරින් අංක 6 හා 7 ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.**

අකුරට යනවයි කියලා - ටිකිරි අයියා බැදිවලමයි
ඉන්නකොා මං ගුරුගෙදරට - ගිහින් කියන්නම්

6. ටිකිරි අයියා නොයන්නේ කොහේ ද?
(1) අකුරට (2) බැදිවල (3) පාසලට


7. ගුරුගෙදරට යන්නේ කවු ද?
(1) ටිකිරි අයියා (2) නංගී (3) මම

8. සාරධා ඉටිපන්දම් පහක් දැල්වූ අතර ඇයගේ මල්ලී වරින් වර ඒවා නිමා දමයි. රූප සටහනින් දැක්වෙන්නේ මල්ලී නිවූ ඉටිපන්දම් ය. ඔහු ඉටිපන්දම් නිවූ අනුපිළිවෙළ වන්නේ,




(1) C , D , B , A , E
(2) E , A , B , D , C
(3) E , B , C , A , D

9. මීයා රවුම් කීයක් තුළ සිටී ද?



(1) 4
(2) 5
(3) 6

10.


1 රූපය



2 රූපය

1 රූපයෙන්, 2 රූපය වැනි රූප කීයක් කපා වෙනත් පොතක ඇලවිය හැකි ද?
(1) 9 යි.
(2) 6 යි.
(3) 4 යි.

11. පහත රූප තුන එකමත එක තැබූවිට නිවැරදි ව පෙනෙන රූප සටහන වන්නේ,





(1) (2) (3)

12. 

විශාල ත්‍රිකෝණය තුළ අඳුරු කර ඇති ත්‍රිකෝණ මෙන් තවත් ත්‍රිකෝණ කීයක් ඇඳිය හැකි ද?

(1) 64
(2) 63
(3) 16

- **දී ඇති විස්තරය හොඳින් කියවා තේරුම් ගෙන 13 හා 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



A රූපයේ දැක්වෙන ආකාරයේ කඩදාසියක් B රූපයේ දැක්වෙන කඩඉරි දිගේ නැමූවිට සමාන කොටස් දෙකක් ලැබේ. A රූපයේ දැක්වෙන කඩදාසිමෙන් කඩදාසි පහක් එක මත එක තබා B රූපයේ ආකාරයට නවා මැදින් කටුවක් ගසා ඇත.

13. මුල් පිටුවේ සිට අග පිටුව තෙක් අංක ලියූවිට ඔබ ලියන අවසාන පිටුවට පෙර සංඛ්‍යාව වන්නේ,

(1) 18 (2) 19 (3) 20

14. මෙහි මැද පිටු දෙකෙහි අංක පිළිවෙළින්,

(1) 10 , 11 (2) 12 , 13 (3) 13 , 14

15. ගණක රාමුවකට ගණක 15 ක් දැමිය යුත්තේ එකස්ථානයේ සිට පිළිවෙළින් ඊළඟට දමන කුරට දෙගුණයක් පිහිටන ලෙස ය. ඒ අනුව සෑදෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය වන්නේ,

(1) නවදහස් හයසිය විසි එක.
(2) අටදහස් හාරසිය විසිඑක.
(3) හාරදහස් හාරසිය විසිඑක.

16. ගාල්ල නගරයට පිවිසෙන ප්‍රධාන මාර්ගයක මෙම පුවරුව දක්නට ලැබේ.




"මෙම පුවරුවේ ගාල්ල නගරයේ දුර සටහන් කර නොමැති නිසා මාතර ගාල්ල හරහා කොළඹට දුර සෙවිය නොහැකි" යැයි ඔබේ මිතුරා පවසන්නේ නම් එම කියමන,

(1) සත්‍යයකි.
(2) අසත්‍යයකි.
(3) නිශ්චිත පිළිතුරක් දිය නොහැක.

17. අක්කාට ගවුම් මැසීමට තාත්තා රෙදි මීටර් හයක් ගෙනාවේ ය. අම්මා එය මැන බැලූවිට තිබුණේ රෙදි මීටර් 5.5 කි. අම්මා ඉන් රෙදි මීටර් $2\frac{1}{2}$ බැගින් ගෙන ගවුම් දෙකක් මැසුවා ය. තවත් එවැනි ම ප්‍රමාණයේ ගවුමක් මැසීමට ගෙන ආ යුතු රෙදි ඉතිරි ප්‍රමාණය කොපමණ ද?

(1) $1\frac{1}{4}$ m කි. (2) 2 m කි. (3) $2\frac{1}{4}$ m කි.

- **පහත සටහන බොඳින් බලා අංක 18 හා 19 ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.**



18. රවුම් දෙකට ආ යුතු ගණිත කර්ම දෙක පිළිවෙළින් ආ යුතු වන්නේ,

(1) + , + (2) - , + (3) + , -


19. C හා D කොටු දෙකට ආ යුතු සංඛ්‍යා පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) 30 , 20 (2) 6 , 30 (3) 42 , 30

20. ගොඩනැගිල්ලක තීන්ත ආලේප කරන්නේ වසර හතරකට වරකි. මෙවර ආලේප කරන්නේ හයවැනි වරට ය. දෙවැනි වරට ආලේප කළේ කුමන වර්ෂයේ දී ද?

(1) 2008 (2) 2012 (3) 2016


21. පහතින් දැක්වෙන්නේ සියලු පැති සමාන හැඩයෙන් යුත් ලී කුට්ටියක් යැයි සිතන්න. එහි සෑම මුල්ලකින් ම කඩ ඉරි දිගේ කපා චතුස්තලාකාර කොටසක් ඉවත්කළ විට පහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය කුමක් ද?



(1) දාර ගණන 30 ට වඩා අඩු ය. 36 ට වඩා වැඩි ය.
(2) දාර ගණන 30 ට වඩා වැඩි ය. 40 ට වඩා අඩු ය.
(3) දාර ගණන 18 කි.

22. ඉවත්කරන ලද චතුස්තලාකාර ලී කුට්ටි සියල්ලේ ඇති මුළු මුහුණත් ගණන,

(1) 32 කි. (2) 24 කි. (3) 20 කි.

23. 

හාවා කැරට් අලය වෙත යන කෙටි ම මාර්ගය වන්නේ,

(1) ↓→→↓↓

(2) →↓→→↑

(3) →↓↓↓→

24. සඳුදා සිට ඉරිදා තෙක් පුවත්පත් මුද්‍රණය කරන මුද්‍රණාලයක පෙර දවසට වඩා පසු දවසේ පුවත්පත් 100 ක් මුද්‍රණය කරයි. බදාදා හා බ්‍රහස්පතින්දා දින දෙකෙහි නිපද වූ පුවත්පත් සංඛ්‍යාව පිළිවෙළින් 1005 , 1105 කි. ඒ අනුව සඳුදා හා ඉරිදා නිපද වූ මුළු පුවත්පත් සංඛ්‍යාව කීය ද?

(1) 2110 (2) 2210 (3) 3210

25. 19 km කණුව පිහිටි ස්ථානයෙන් ගමන ආරම්භ කළ මෝටර් රථයක් 39 km කණුව පිහිටි ස්ථානයෙන් ගමන නිමාවිය. ඒ අනුව ගමන් කළ දුර 20 km කි. මේ ගමන අතර මෝටර් රථය පසුකර ගිය කිලෝමීටර් කණු ගණන කීය ද?

(1) 18 කි. (2) 19 කි. (3) 20 කි.

26. 450 g ක් බරැති ඝනකාභයක හැඩය ගත් පාන් ගෙඩියකින් සමාන බරැති පාන් පෙති 15 ක් කපා ගත හැක. එම පාන් පෙති දෙකක් එක්කොට ත්‍රිකෝණ හැඩැති සැන්විච් දෙකක් සාදාගත හැක. සාදයක් සඳහා සැන්විච් 120 ක් සාදා ගැනීමට මෙවැනි පාන්ගෙඩි කීයක් ගෙන ආ යුතු ද?


(1) 10 කි. (2) 9 කි. (3) 8 කි.


27. විශාල භාජනයක ඇති බීම ප්‍රමාණය සමාන බෝතල් හයකට දැමිය හැක. එම එක් බෝතලයක බීම සමාන වීදුරු පහකට දැමිය හැක. එවැනි බීම වීදුරු 150 ක් සාදාගැනීමට විශාල භාජන කීයක් අවශ්‍ය වේද?


(1) 5 කි. (2) 6 කි. (3) 7 කි.

28. පහත කවියට ගැළපෙන සතා තෝරා යටින් ඉරක් අඳින්න.

වැලි කතරේ ඇවිදින්නේ
බරපොදි අරගෙන යන්නේ
මිනිසුන් පිට උඩ යන්නේ
මා කවුදැයි පවසන්නේ


(1)


(2)


(3)

29. 1 හැර ඊළඟට පිළිවෙළින් හමුවන ඔත්තේ සංඛ්‍යා හය ඝනකයක අලවා ඈන්, සාරධා හා පාරමී ක්‍රීඩාවක් කළෝ ය. එක් අයෙකුට ඝනකය උඩ දැමීමට අවස්ථා තුනක් ලබා දෙන ලදී. අවස්ථා තුනේ දීම ලබාගත් ලකුණු එකතුකර වැඩි ම අගය ලබාගත් අය ජයග්‍රාහකයා වේ. ඈන්ට අවස්ථා තුනේ දීම වැඩි ම අගය ලැබුණි. ඈ ලබාගත් මුළු ලකුණු ගණන කීය ද?

(1) 33 (2) 39 (3) 45

30. 18 : 20 ලෙස සටහන්ව ඇති ඩිජිටල් ඔරලෝසුවක මෙම ඉලක්කම් සියල්ල ම යෙදෙන ඊළඟ ලැබෙන වේලාව සටහන් වන්නේ කෙසේ දැයි දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(1) 20 : 81 (2) 20 : 18 (3) 21 : 08


31. පහත ඡේදය කියවන්න.

ශ්‍රී ලංකාවේ උගව පළාතේ, බදුල්ල නගරයට කි.මී. 5 ක් පමණ දුරින් දුන්හිඳ දියඇල්ල පිහිටා ඇත. එහි උස මීටර් 64 කි. (අඩි 210 කි) බදුල්ල නගරය හරහා ගලා බසින බදුලු ඔය මෙම මනරම් දිය ඇල්ල නිර්මාණය කරයි.

- මෙම ඡේදයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ලංකාවේ උසින් දෙවන තැන හිමිවන්නේ දුන්හිඳ දිය ඇල්ලට ය.
(2) දුන්හිඳ දිය ඇල්ල බදුල්ල නගරයේ ගලා බසියි.
(3) දුන්හිඳ ඇල්ල නිර්මාණය වන්නේ බදුලු ඔයෙනි.

32.



රූපයේ දැක්වෙන පෙට්ටිය රිබන් පටි දෙකක් යොදා ගෙන තදින් ගැටගසා ඇත. ගැටය සඳහා එක් රිබන් පටියකට 5 cm බැගින් වැඩිපුර තබා ඇත. ඒ අනුව පෙට්ටිය වටා ඇති රිබන් පටි දෙකෙහි මුළු දිග කොපමණ ද?

(1) 64 cm (2) 108 cm (3) 118 cm

33. 4 වන ශ්‍රේණියේ සිසුවකු තමා සෑදූ ඇටවුමක් යහළුවන්ට විස්තර කළ ආකාරය පහත දැක්වේ. එම අවස්ථා පහ ඇත්තේ නිවැරදි පිළිවෙළකට නොවේ. එහි නිවැරදි පිළිවෙළ ඇතුළත් පිළිතුර තෝරන්න.


1. යකඩ ඇණය කෙළවරේ ඇල්පෙනෙති ඇල වී තිබෙනු දක්නට ලැබේ.
2. යකඩ ඇණයක්, කොයිල් කම්බියක්, වියළි කෝෂයක්, අල්පෙනෙති කිහිපයක් සපයා ගන්න.
3. කොයිල් කම්බි දෙකෙළවර වියළි කෝෂයේ ධන (+) හා සෘණ (-) අග්‍රවලට සම්බන්ධ කරන්න.
4. යකඩ ඇණය වටා කොයිල් කම්බිය ඔතන්න.
5. යකඩ ඇණය අල්පෙනෙතිවලට ළං කරන්න.

(1) 2, 4, 3, 1, 5 (2) 2, 4, 3, 5, 1 (3) 2, 4, 1, 3, 5

34. වීදුරු බෝල අටක් අතටගත් සුපිපි සමාන පෙට්ටි හතරකට, එක් පෙට්ටියකට එකක්වත් දැමෙන පරිදි පෙට්ටි හතරට ම දැම්මා ය. එම වීදුරු බෝල අට පෙට්ටි හතරට ම දැමිය හැකි විවිධ අවස්ථා කීයක් තිබේ ද?

(1) තුනකි. (2) හතරකි. (3) පහකි.

- **අපේ නිවසේ සිට මං සන්ධියට දුර කිලෝමීටරයකි. ඒ අතර පන්සල හා පාසල පිහිටා ඇත. පහත සටහනින් එය නිරූපණය වේ. ඒ අනුව 35 හා 36 ප්‍රශ්නවලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**




35. පන්සලේ සිට පාසලට දුර කොපමණ ද?

(1) 750 m කි. (2) 500 m කි. (3) 250 m කි.


36. දිනපතා ඒකාකාර වේගයකින් ගමන් කරන මා හට නිවසේ සිට මං සන්ධියට යාමට මිනිත්තු 15 ක් හා ඒමට මිනිත්තු 20 ක කාලයක් ගතවේ. ඒ අනුව නිවසේ සිට මං සන්ධියට ගොස් නැවත පන්සල වෙත පැමිණීමට මට ගතවන කාලය කොපමණ ද?

(1) පැය $\frac{3}{4}$ කි. (2) පැය $\frac{1}{2}$ කි. (3) පැය $\frac{1}{4}$ කි.

37. කුඩා ඝනක කිහිපයක් එක් කොට මෙම ඝනකාභය නිර්මාණය කර තිබේ. රූපයේ පෙනෙන පැතිවල නිල්පාට ද නොපෙනෙන පැතිවල රතු පාට ද ආලේප කර තිබේ. ඒ අනුව කුමන පැත්තක හෝ රතු පාට තීන්ත ගෑවුණු ඝනක කීයක් තිබේ ද?




(1) 20 කි. (2) 13 කි. (3) 12 කි.

38. 

සිරිමල් මෙම රූපය කඩදාසියක ඇඳ පසුව එම ඉරි දිගේ කපා හැඩතල වෙන් කර ගත්තේ ය. ඔහුට ලැබුණු ත්‍රිකෝණ හා චතුරස්‍ර හැඩතල පිළිවෙළින් කීය බැගින් ලැබුණේ ද?

(1) 6 , 10 (2) 6 , 4 (3) 6 , 6

39. පහත කොටුතුළ ඇති සතුන් 2 සිට 9 තෙක් ඉලක්කම්වලින් කුමන හෝ ඉලක්කමක් නියෝජනය කරයි. එක ම අංකය කිහිපදෙනෙක් නියෝජනය නොකරති. එම අංක දෙකක එකතුව පහතින් දක්වා ඇත. " ? " ස්ථානයට ලැබිය යුතු උපරිම අගය කීය ද?




14 10 8 12

?

(1) 14

(2) 30

(3) 44

40. 

මෙම සිලින්ඩරාකාර ලී කුට්ටිය රූපයේ දැක්වෙන ආකාරයට කඩඉරි දිගේ කපා වෙන් කළ විට ලැබෙන මුහුණත් ගණන කීයදැයි තෝරා යටින් ඉරක් අඳින්න.

(1) 8 කි. (2) 10 කි. (3) 12 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි [All Rights Reserved]

කළුතර අධ්‍යාපන කලාපය - ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු ප්‍රභා - ජූනි

5 ශ්‍රේණිය - 2024

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කළුතර අධ්‍යාපන කලාපයේ අවසරයකින් තොරව "සිසු ප්‍රභා" ප්‍රශ්න පත්‍රයේ කොටස් උපුටා ගැනීම අලෙවි කිරීම සපුරා තහනම් වේ.

II පත්‍රය

කාලය : පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය :.....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ **විභාග අංකය** මේ කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසි කොළයක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMP
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදිය	V/I/S/CH

1. පහත ඡේදය හොඳින් කියවා එය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙතෙක් පැවති කාලගුණය වෙනස් වී ගහ කොළ පෙරළාගෙන සුළං පාරක් හමන්නට විය. අහසේ වැහි ලකුණු පහළවිය. වලාකුළු නග්න හිරු වටා සළු පොරවන්නට විය. කැළඹුණු අහස්තලය හරහා කුරුලු රෑන් වේගයෙන් පියඹා යන්නට වූහ.

අහස් තලයෙහි පැහැබර සඳ බබළන්නට විය. රිදීපාට සඳරැසින් මුළු වන පෙත ම සැනසෙන්නට පටන් ගත්තේ ය. වන දහන සතුටු කරමින් ගලා ගිය ගංගා කුමරිය තව තවත් හැඩ ගැහුණේ සඳරැස් වැළඳ ගැනීමට මෙන් ය. මේ මනහර රාත්‍රියේ ගලා එන සිසිල් සුළඟින් මල් සුවඳ පැතිර ගියේ ය.

(i) පළමු ඡේදයෙන් විස්තර වන අවස්ථාව කුමක් ද?

.....

(ii) හිරු වලාකුළුවලින් වැසීගිය බව දැක්වෙන වාක්‍යය තෝරා ලියන්න.

.....

(iii) වන දහන සතුටු කරමින් ගලාගියේ කවුරුන් ද?

.....

(iv) මෙහි සඳහන් බහුවචන ප්‍රාණවාචි වාක්‍යය ලියන්න.

.....

(v) "උණුසුම්" යන පදයට විරුද්ධාර්ථ පදය ඡේදයේ සඳහන් වේ. එය තෝරා ලියන්න.

.....

(vi) මල් සුවඳ පැතිර ගියේ කුමක් නිසා ද?

.....

2. පහත වාක්‍යයට ගැළපෙන විරාම ලක්ෂණ යොදන්න.

සවනිගෙන් ලියුමක් රාධාගේ මුහුණේ සිනාවක් මතුවිය

3. මුලින් දී ඇති පදයට සමාන තේරුම ඇති වචනය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) නෙලුම් මල (කුමුදු , සියපත , කුසුම)

(ii) දූපත (මාරුතය , අර්ධද්වීපය , දිවයින)

4. පහත වාක්‍යවල ඉරි ඇඳි අක්ෂරවල සඳහන් පිල්ලම හිස්තැන මත ලියන්න.

(i) අපේ ගෙදර ඇති <u>රූ</u>පවාහිනියේ <u>රූ</u>පරාමු ඉතා පැහැදිලිය.

.....

(ii) <u>ගෘ</u>හ අලංකාරය සඳහා <u>කෘ</u>ත්‍රිම ශාක වර්ග භාවිතයට ගැනේ.

.....

5. පහත කොටුව තුළ ඇති වචනවලින් සුදුසු උක්ත පද යොදා වාක්‍යය සම්පූර්ණ කරන්න.

ක්‍රීඩකයන් , මා , වැහිබිඳු , ක්‍රීඩකයෝ , නංගී , සුළඟ , මම

(i) ..... සට සට ගාමින් බිමට පතිත විය.
(ii) ..... ජය පරාජය සම සිතින් පිළිගනිති.
(iii) ..... අලංකාර චිත්‍රයක් ඇන්දා ය.

6. පහත දැක්වෙන පදවල අදහස ඉදිරියෙන් ඇති හිස්තැන මත ලියන්න.
(i) සේරුව - .....
(ii) සෙක්කුව - .....

7. පහත දී ඇති සෑම පද පේළියකම වැරදියට මුද්‍රණය කර ඇති වචනය යටින් ඉරක් අඳින්න.
(i) ජයග්‍රහනය , බරපතළ , වලාකුළ , හැලප
(ii) කනගාටුව , කුරුලු , විමර්ශණ , ගිනිමැළ
(iii) අලුවා , අත්පොළසන් , අයිකාය , අග්ගළා

8. පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් පුරවා සම්පූර්ණ කරන්න.
(i) කටුස්සාගේ කරේ ..... බැන්දා වගේ.
(ii) ඉඟුරු දී ..... ගත්තා වගේ.

9. පහත දී ඇති කවියේ හිස්තැනට අදාළ කවි පද දෙක සම්පූර්ණ කරන්න.

ඉර උදා වෙන්න ට
.....
.....
කරන් වැඩපල දියුණුවන්නට

10. පහත එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල වචනය** ලියන්න.
(i) bushes - .....
(ii) river - .....

11. පහත සඳහන් ඉංග්‍රීසි වාක්‍යයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.
I have ten fingers - .....

12. පහත සඳහන් වාක්‍යයෙහි අර්ථය ඉංග්‍රීසියට හරවා **ඉංග්‍රීසි අකුරෙන්** ලියන්න.
එහි මල් කීයක් තිබේ ද? - .....

13. පහත දී ඇති දෙමළ වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.
තිරවුංගළ් - .....

14. පහත වගන්තිය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.
ඔබේ වයස කීය ද? - .....

15. අටදහස් හතළිස් පහ සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.
: .....

16. (i) පහත සංඛ්‍යාව ස්ථානීය අගය අනුව විහිදුවා ලියන්න.
9612
..... + ... + ... + ...
(ii) මෙම සංඛ්‍යාවේ 6 ඉලක්කමෙන් නිරූපිත අගය කීය ද? .....

17.

9	4
2	6


කොටුව තුළ ඇති ඉලක්කම් ඇසුරෙන් ලිවිය හැකි විශාලම සංඛ්‍යාව හා කුඩා ම සංඛ්‍යාව අතර වෙනස කීය ද?
: .....

18. රටාව තේරුම් ගෙන හිස්තැන් පුරවන්න.
(i) ..... , ... , 41 , 44 , 47 , 50
(ii) ..... , 34 , 38 , 42 , ... , 50

19. 307 , 5 න් ගුණ කළ විට ලැබෙන පිළිතුර කීය ද? : .....

20. භාජනයකට අල්ලන උපරිම ජල ප්‍රමාණය ලීටර 5 කි. එහි මිලිලීටර 270 ක ජල ප්‍රමාණයක් ඇති අතර එය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය ද?
: ..... *l* ..... m*l*

21. පොත් 824 ක් පෙට්ටි 4 කට සමානව අසුරන ලදි. එක් පෙට්ටියකට අසුරන ලද පොත් සංඛ්‍යාව කීය ද?
: .....

22. 

රූපයේ ඇති දොඩම් ගෙඩි ගොඩෙන් හතරෙන් පංගු තුනක් ($\frac{3}{4}$) දොඩම් ගෙඩි කීය ද?
: .....


23. තරාදියක එක තැටියකට කොමඩු ගෙඩියක් සහ 50 g පඩියක් දමා එහි බරට සමාන වීමට 1 kg පඩියක් සහ 100 g පඩියක් අනෙක් තැටියට දමන ලදි. කොමඩු ගෙඩියේ බර කොපමණ ද?
: ..... kg ..... g

24. මීටර 8 ක් දිග රෙද්දකින් ගවුමක් මැසීම සඳහා මීටර 2 සෙන්ටිමීටර 75 ක් ප්‍රමාණයක් කපා ඉවත් කළේ නම් ඉතිරි රෙදි ප්‍රමාණය කොපමණ ද?

: ..... m ..... cm

25. රුපියල් 190 ක අන්නාසි ගෙඩියක් සහ රුපියල් 125 ක පැපොල් ගෙඩි තුනක් මිල දී ගෙන රුපියල් 1000 ක නෝට්ටුවකින් මුදල් ගෙවූ විට ලැබෙන ඉතිරි මුදල කීය ද?

රුපියල් : .....

26. 

ඔරලෝසු මූහුණතේ දැක්වෙන වේලාව ඉලක්කමෙන් ලියන්න.

: .....

27. පලතුරු බීම කම්හලක නිපද වූ පලතුරු බීම බෝතල් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

	අඹ බීම	දොඩම් බීම
ජූනි	1694	1425
ජූලි	1073	683


(i) ජූනි, ජූලි මාසවල නිපදවන ලද දොඩම් බීම බෝතල් සංඛ්‍යාව අතර වෙනස කීය ද?

: .....

(ii) ජූනි මාසයේ නිපද වූ මුළු බීම බෝතල් සංඛ්‍යාව කීය ද?

: .....

28. පහත සෘජුකෝණාස්‍රයේ සමමිති රේඛා දෙකක් අඳින්න.



29. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

	1 kg ක මිල		ප්‍රමාණය	මිල	
	රුපියල්	සත		රුපියල්	සත
සීනි	240	00	500 g	120	00
තේ කොළ	750	00	100 g	(i)	.....
පාන් පිටි	(ii)	.....	250 g	180	00

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. ශ්‍රී ලංකාවට ආවේනික ශාකයකි.
(1) අඹ (2) පොල් (3) හොර


31. සතුන්ගේ පැවැත්මට හානි කරන ආකාරයේ මිනිස් ක්‍රියාකාරකමක් වන්නේ,
(1) කැලෑ එළි කිරීම. (2) වාසස්ථාන සැපයීම. (3) ගස්වැල් වැවීම.

32. මෙම සතුන් අතරින් සර්ව භක්ෂක සත්ත්වයෙකු වන්නේ,
(1) ගවයා (2) කපුටා (3) කොටියා

33. තම කුඩුව තමා විසින් සාදා නොගන්නා පක්ෂියා නම්,
(1) කවුඩා (2) කොණ්ඩ කුරුල්ලා (3) කොහා

34. මෙම රූප අතරින් උකුස්සෙකු ගේ පාද වන්නේ,


(1)



(2)


(3)

35. කෝලම් රටා සඳහා මූලිකත්වය දෙන ජාතිය වන්නේ,
(1) සිංහල (2) දමිළ (3) බර්ගර්

36. සනකම වැඩි ශාක පත්‍රයක් නම්,
(1) කරවිල (2) කටරොළු (3) අක්කපාන


37. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය ලෙස නම් කර ඇත්තේ,
(1) නා ගස (2) සල් ගස (3) බෝ ගස

38. 
මෙම රූප සටහනේ දැක්වෙන්නේ.
(1) අන්වීක්ෂයකි.
(2) සිදුරු කැමරාවකි.
(3) ටෙලිෆෝනයකි.


39. හිරු එළිය හොඳින් නොලැබුණු විට තණකොළවල දැකිය හැකි ලක්ෂණයකි.
(1) තණකොළ කහ පැහැ වී තිබීම.
(2) තණකොළ තද කොළ පැහැවීම.
(3) ඉතා සරුවට වැවී තිබීම.

40. බසවක්කුලම වැව පිහිටා ඇත්තේ,
(1) පොළොන්නරුවේ ය.
(2) අනුරාධපුරයේ ය.
(3) ත්‍රිකුණාමලයේ ය.

41. පැරණි සන්නිවේදන ක්‍රමයක් වන්නේ,
(1) ගුවන්විදුලිය.
(2) දුරකතන ඇමතුම් ලබාදීම.
(3) අණ බෙර වැයීම.

42. 
මෙම රූපයේ දැක්වෙන්නේ කුමක් ද?
(1) නැවක රූපයකි.
(2) කප්පිය යොදා ගන්නා අවස්ථාවකි.
(3) ජල රෝදයකි.

43. මුළුතැන්ගෙයි උපකරණයක් ආශ්‍රයෙන් නිර්මාණය වූ නැටුමකි.
(1) ලී කෙළි නැටුම (2) කුලු නැටුම (3) සවරං නැටුම

44. 
මෙම සරල ඇටවුම යොදා ගැනීමෙන් කළ හැකි දෙයකි.
(1) ජලය පෙරා ගැනීම.
(2) ආහාර නිෂ්පාදනය කිරීම.
(3) ජලය හොඳින් මිශ්‍ර කිරීම.

45. පන්ති කාමරයේ දී සිසුන් පරිහරණය නොකරන දෙයක් නම්,
(1) ගුරු පුටුව (2) ළමා පුටුව (3) ළමා මේසය

46. පාන් කැබැල්ලක් නරක් වූ විට ඇතිවන ලක්ෂණයකි.
(1) පුස් ඇල්ලීම. (2) ඉමිහිරි රසය. (3) සුගන්දය.

47. අනතුරු සිදුවිය හැකි ස්ථානයක් වන්නේ,
(1) වසා නොදැමූ පතල්
(2) ඒ දණ්ඩ
(3) ඉහත සියල්ලම.

48. මෙහි දැක්වෙන මැස්ම නම්,
(1) වාටි මැස්ම
(2) නූල් දුවවීම
(3) නැටි මැස්ම



49. පාන්පිටි ස්වල්පයක් ජලයේ දිය කළවිට,
(1) ජලයේ දිය නොවේ.
(2) ජලයේ දිය වේ.
(3) ජලය නිල් පැහැ ගනියි.

50. නිවසේ දී හෝල්ඩරයකට බල්බය දැමීමේ දී කළ යුතු දෙයකි.
(1) ස්විච්චිය දැමීම.
(2) හිස්වැසුම් පැළඳීම.
(3) ප්‍රධාන පරිපථ යොමුව විසන්ධි කිරීම.

51. සුබ පැතුම් පතක් යැවීමෙන් ලැබෙන දෙයක් නම්,
(1) සුහදතා වර්ධනය. (2) සිත් අමනාපය. (3) කාලය නාස්ති වීම.

52. මෙම රූපයේ දැක්වෙන්නේ,
(1) ආචාර්ය ටී. බී. ජයා මැතිතුමා
(2) ආතර් සී. ක්ලාක් මැතිතුමා
(3) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා



53. පාදයේ ආබාධයක් ඇති අයෙකු දුටු විට උදව් කළ හැකි ක්‍රමයකි.
(1) පිනට යමක් දීම.
(2) නොදුටු ලෙස සිටීම.
(3) පඩිපෙළ නැගීමට උදව් වීම.

54. බල්ලෙකු සපා කෑ විට ප්‍රථමයෙන් කළ යුතු දෙයකි.
(1) රෙදි පටකින් තදින් බැඳීම.
(2) ගලා යන පිරිසිදු ජලයෙන් සේදීම.
(3) වේදනා නාශක පෙති පානය කිරීම.

55. "වනපත්ව බියපත්ව සයනම්" මෙම කොටස අයත් වන්නම වන්නේ,
(1) මුසලඩි වන්නම. (2) තුරඟා වන්නම. (3) ගජඟා වන්නම.

56. පරිසරයට හිතකර ලෙස "මඟුල් පෝරුවක්" සෑදීමට යොදා ගත හැකි දෙයක් නම්,
(1) රෙජිෆෝම් (2) ඉටිකොළ (3) ගොක්කොළ

57. මිනිසුන් අපහසුතාවයට පත් වන අවස්ථාවකි.
(1) ආචාරශීලීව හැසිරීම.
(2) අපිරිසිදුව මිනිසුන් අතර ගැවසීම.
(3) වැඩිහිටියන් දුටුවිට අසුනින් නැගිටීම.

58. වර්ෂාපතනය මනිනු ලබන මිනුම් ඒකකය වන්නේ,
(1) මිලිමීටර් (2) සෙන්ටිමීටර් (3) මිලිලීටර්

59. ශ්‍රව්‍ය, දෘෂ්‍ය සන්නිවේදන මාධ්‍යයක් නොවේ.
(1) රූපවාහිනිය (2) ගුවන්විදුලිය (3) වේදිකාව

60. **"මගේ අනාගත බලාපොරොත්තුව"** යන මාතෘකාව යටතේ අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. එක් වාක්‍යයක වචන පහකට වැඩි විය යුතු අතර උක්තාඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු යි.

1. .....
.....
2. .....
.....
3. .....
.....